සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 16 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

**විභාග අංකය ....................................** **ඉස්ලාම්** **කාලය පැය 01 යි.**

- **නිවැරදි පිළිතුර යටින් ඉරි ගසන්න.**

1. ආගම් හා සුහුෆු පහළ වූ නබිතුමා කවුද?
   (i) ඊසා(අලෛ) (ii) ආදම් (අලෛ) (iii) මූසා(අලෛ) (iv) ෂීද් (අලෛ)

2. 'අත්තහාරත්' යන අරාබි පදයේ තේරුම වන්නේ,
   (i) ඉතා අපිරිසිදු (ii) අපිරිසිදු (iii) චින්තන (iv) පිරිසිදු

3. සුහුෆ් කිහක් ලැබූ නබිතුමා
   (i) ඉද්රීස් (අලෛ) (ii) ෂීද් (අලෛ) (iii) ආදම් (අලෛ) (iv) මූසා (අලෛ)

4. ඉස්ලාමීය අකීදා කලාව අමතනු ලබන්නේ,
   (i) ඉල්මුල් ෆික්හ් (ii) ඉල්මුල් හදීස් (iii) ඉල්මුල් පරාසිල් (iv) ඉල්මුල් අකීදා

5. කියාමත් දිනය සම්බන්ධ අකීදා කොටස
   (i) අර්රූහානියාත් (ii) අස්සම්ඉයියාත් (iii) අන්නුබුව්වාත් (iv) අල් ඉලාහියියාත්

6. තක්බීර් තහ්රීම් යනු,
   (i) ප්‍රථම තක්බීර් (ii) අවසාන තක්බීර්
   (iii) රුක්උවෙහි කියන දු ආ (iv) සුජූද්වල කියන දු ආ

7. "අයහපත් ක්‍රියා හා පිළිකුල් ක්‍රියා වලින් මිදී ආරක්ෂා කරයි" යනුවෙන් අල්කුර්ආනයේ පවසා ඇති. වගකීම
   (i) සලාතය (ii) අස්සව්ම් (iii) හජ් (iv) සකාත්

8. කුල්ලතෙන් ජලයෙහි ප්‍රමාණය
   (i) ලීටර 110 යි. (ii) ලීටර 120 යි. (iii) ලීටර 210 යි. (iv) ලීටර 220 යි.

9. අල් මාඋන් කසීර් යනු,
   (i) අපිරිසිදු ජලය (ii) භාවිතා කළ ජලය (iii) අඩු (සුළු) ජලය (iv) වැඩි (විශාල) ජලය

10. සලාතයේ ඉෆ්තිරාෂ් ඉඳුම යැයි කියනු ලබන්නේ,
    (i) මැද ඉඳුම. (ii) සුජූද්වල යෙදීම.
    (iii)අවසාන අත්තහියියාත් වලට හිඳ ගැනීම. (iv) රුකූඋවෙන් පසු නැගිට සිටීම.

11. පිරිසිදු මනස යන අදහස දෙන පදය
    (i) තව්බා (ii) තවක්කුල් (iii) ඉහ්ලාස් (iv) වරඋ වේ.

12. මිදීම හෝ හැරීම යන අර්ථය දෙන පදය
    (i) ෂුහුද් (ii) වරඋ (iii) තව්බා (iv) ඉහ්ලාස්

13. සුරතුල් ෆලක් හී ඇති වැකි ගණන,
    (i) 3 (ii) 4 (iii) 5 (iv) 6

14. සත්‍ය වශයෙන්ම හොඳ දේවල් නරක දේවල් විනාශ කරයි යනු,
    (i) කුර්ආන් වැකියකි. (ii) සහාබිවරයෙකුගේ වැකියකි.
    (iii) නබි (සල්) තුමාණන්ගේ වැකියකි. (iv) උගතෙකුගේ වැකියකි.

15. වුළු වෙනුවට ඉටුකළ හැකි වන්නේ,
(i) ජබීරත් (ii) සලාත් (iii) තයම්මුම් (iv) ෂහාදත්

16. අර්රහීම් යන පදයේ තේරුම,
(i) අසීමිත කරුණාවන්තයා. (ii) අසම දයාවන්තයා.
(iii) පව් මකාදමා ක්ෂමා කරන්නා. (iv) සියලු ප්‍රසංශා හිමි තැනැත්තා.

17. අපි විශ්වාස කළයුතු කරුණු,
(i) 4 (ii) 5 (iii) 6 (iv) 7

18. සූර්යානි භාෂාවෙන් පහළ වූ දේව ආගම
(i) තව්රාත් (ii) සබූර් (iii) ෆුර්කාන් (iv) ඉන්ජීල්

19. වුළු කිරීමට භාවිතා කළ යුතු ජලය
(i) අල්මාඋල් මුස්තඃමල් (ii) අල්මාඋන් මුතනජ්ජිස්
(iii) අල්මාඋන් තාහිර් (iv) අල්මාඋන් තහුර්

20. 2018 වර්ෂය කිනම් හජ් වර්ෂයද?
(i) 1436 (ii) 1338 (iii) 1439 (iv) 1437

21. අල්කුර්ආන් පහළ වූ (ආකාරය) පිළිවෙල
(i) තර්තීබුන් නුසුල් (ii) තර්තීබුන් තිලාවත් (iii) තර්තීබුල් කිරාඅත් (iv) තර්තීබුල් උසුල්

22. තක්බීර් හතක් කියවෙන සලාතය කුමක්ද?
(i) තරාවීහ් සලාතය (ii) ජනාසා සලාතය (iii) ඊත් සලාතය (iv) විත්රු සලාතය

23. 'හිදායත්' යන පදයේ අර්ථය
(i) දූතභාවය (ii) නබිත්වය (iii) ඍජු මග (iv) නොමඟ

24. මුජාහිදතුන් නෆ්ස් යන අරාබි පදයේ අර්ථය
(i) විරුද්ධවාදීන් සමඟ සටන් වැදීම. (ii) මනස් සටන.
(iii) දිවෙන් සටන් කිරීම. (iv) යුද්ධයේ සටන් කිරීම.

25. අහ්ලුස්සුන්නා වල්ජමාආ ලෙස අමතන්නෝ,
(i) ඉමාම්වරුන්ව පිළිපදින්නෝ.
(ii) සූෆිවරුන්ව පිළිපදින්නෝ.
(iii) නබි (සල්) තුමාණන් හා සහාබාවරුන් පිළිපදින්නෝ.
(iv) සහාබාවරුන්ව පමණක් පිළිපදින්නෝ.

26. නබිවරුන්ගේ පරපුර ලෙස හැඳින්වෙන්නෝ,
(i) ධනපතිවරුන් (ii) උගතුන් (iii) දුප්පතුන් (iv) වැඩිහිටියන්

27. මත්ද්‍රව්‍ය කුමන නජීසයට අයත්ද?
(i) කඨින නජීස් (ii) මෘදු නජීස් (iii) සාමාන්‍ය නජීස් (iv) අධිකඨින නජීස්

28. ජනාසාවක වගකීම් ඉටුකිරීම
(i) ෆර්ලු අයින් (ii) ෆර්ලු කිෆායා (iii) මක්රූහ් (iv) සුන්නත්

29. නබිවරුන්ට පහළ වූ සුහුෆුවල ගණන
(i) 100 (ii) 150 (iii) 130 (iv) 110

30. නබි (සල්) තුමාණන් ඉපදුණු වර්ෂය
(i) ක්‍රි.පෙ 570 (ii) ක්‍රි.පෙ 571 (iii) ක්‍රි.ව.ප 570 (iv) ක්‍රි.ව.ප 571

31. ජමාඅත් ලෙස ඉටුකළ හැකි සුන්නත් සලාතයක් වන්නේ
(i) සලාතුස්සෆර් (ii) සලාතුල් හාජත් (iii) සලාතුල් ඉෂ්රාක් (iv) සලාතුල් ඊදෙයින්

32. X කොටසෙහි ඇති පද වලට Y කොටසෙහි ඇති පද ගැළපූ විට ලැබෙන පිළිවෙල

| X කොටස | Y කොටස |
|---|---|
| සලාතය | A මීසාන් |
| හජ් | B තයම්මුම් |
| කියාමත් දිනය | C කස්රු |
| වුළුඃ | D තවාෆ් |

(i) CDBA (ii) CDAB (iii) CADB (iv) CBAD

33. වහී මත්ලූ නැමති කොටසට අයත්වන්නේ,
(i) අල්කුර්ආන් (ii) හදීස් (iii) සුන්නා (iv) ඉජ්මා

34. නබි මූසා (අලෛ) හා සම්බන්ධවන කන්ද කුමක්ද?
(i) ජුදියියු කන්ද (ii) සෆා කන්ද (iii) තූර්සිනා කන්ද (iv) මර්වා කන්ද

35. දූ ආ උල් ඉෆ්තිතාහ් පාරායනා කරන අවස්ථාව
(i) සුජුදෙහි (ii) රුක්උවෙහි
(iii) ඉෘතිදාල්වල සිටීමේදී (iv) ආරම්භ තක්බීර් බැඳපු වේලාවේදීය.

36. තයම්මුම් කළ හැකි අවයවයන්
(i) 2 (ii) 3 (iii) 4 (iv) 5

37. ධනය සමඟ සම්බන්ධවන ක්‍රියාවක් වන්නේ
(i) සලාතය (ii) නෝම්බි (iii) දික්ර් (iv) සකාත්

38. අල්කුර්ආනය පවසන මනසෙහි (හදවතෙහි) කොටස්
(i) 2 (ii) 3 (iii) 4 (iv) 5

39. අල්ලාහ් පරිශුද්ධවන්තයා යන අර්ථය දෙන අරාබි පදය
(i) අල්ලාහු අක්බර් (ii) අල්හම්දුලිල්ලාහ් (iii) මාෂා අල්ලාහ් (iv) සුබ්හානාල්ලාෆ්

40. "අල් ඉලාහියියාත්" යනුවෙන් සඳහන් වන්නේ,
(i) නබිවරුන් පිළිබඳ (ii) පරලොව පිළිබඳ (iii) ජින්වරුන් පිළිබඳ (iv) අල්ලාහ් පිළිබඳ

(1x 40 = ලකුණු 40)

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 16 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... ඉස්ලාම් II කාලය පැය 02 යි.

- **පළමු ප්‍රශ්නයට හා වෙනත් ප්‍රශ්න හතරකට එකතුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

(01) කෙටි උත්තර ලියන්න.
1. ශරීරය සම්බන්ධ වගකීම් 02ක් ලියන්න.
2. කඨින නජීසයට උදාහරණ 02ක් ලියන්න.
3. තවර්රුක් ඉඳුව යනු කුමක්ද?
4. මාඋන් තාහිර්යට උදාහරණ 4ක් ලියන්න.
5. මෘදු නජීස් තැවරුණු විට එය පිරිසිදු කරන ආකාරය ලියන්න.
6. ආගම් පහළ වූ රසූල්වරුන් දෙදෙනෙක් නම් කරන්න.
7. සිෆාත් යන අරාබි පදයේ අර්ථය ලියන්න.
8. අන්නුබුව්වාත් යන අරාබි වචනය සඳහන් කරන්නේ කුමක්ද?
9. හජ් වන්දනාවේදී වැඩි වාරයක් මකත් කරන නබිතුමා කවුද?
10. ජබීරත් යනු කුමක්ද? (10 x 2 = ලකුණු 20)

(02) I. ඉබාදාවෙහි වර්ගවලින් ෆර්ලු වර්ග දෙක ලියන්න.
II. ඉස්ලාමීය අකීදාව ආරක්ෂා කළ ඉමාම්වරුන් තුන්දෙනෙක් නම් කරන්න.
III. මිනිසෙකුගේ දිනපතා කරන ක්‍රියාවන් ඉබාදත් ලෙස ඉටුවීමට ඇති කොන්දේසි 05ක් ලියන්න.
(2+3+5 = ලකුණු 10)

(03) I. සලාතය ගැන පවසන කුර්ආන් වැකිය හෝ හදීසයක් ලියන්න.
II. සුන්නත් සලාතයට උදාහරණ 03ක් ලියන්න.
III. සලාත මඟින් ලැබෙන ආත්මික ප්‍රයෝජන 5ක් ලියන්න. (2+3+5 = ලකුණු 10)

(04) I. සාලිහ්වන්ත ක්‍රියා යනු කුමක්ද?
II. පවිත්‍රත්වය ගැන කියවෙන කුර්ආන් වැකියක් හෝ හදීසයක් ලියන්න.
III. කඨින නජීසය තැවරුණු විට පිරිසිදු කරන අයුරු සඳහන් කරන්න. (2+3+5 = ලකුණු 10)

(05) I. "තස්කියා" යන පදයෙහි තේරුම කුමක්ද?
II. අල් කුර්ආනය සඳහන් කරන මිනිස් මනසේ වර්ග තුන මොනවාද?
III. පිරිසිදු සිතක් ඇතිවීමට කළ යුතු ක්‍රියාවල් 5 ක් ලියන්න. (2+3+5 = ලකුණු 10)

(06) I. "රහ්බානියියා" යන පදයෙන් අදහස් කරන්නේ කුමක්ද?
II. මුස්ලිම්වරයෙකු පිළිපැදිය යුතු ආත්මික ගුණාංග 03 ක් ලියන්න.
III. තව්බා කිරීමට ඇති කොන්දේසි කුමක්ද? (2+3+5 = ලකුණු 10)

(07) I. තයම්මුම් කිරීමට ඇති අවස්ථා දෙකක් ලියන්න.
II. නබි (සල්) තුමාණන් පස්වේල සලාතයෙන් පසු පාරායනා කළ දු ආ තුනක් ලියන්න.
III. අකීදාවෙහි වෙනස්කම් ඇතිවීමට මග පෑ කාරණා පහක් ලියන්න. (2+3+5 = ලකුණු 10)

**පළමු වාර පරීක්ෂණය**
**10 ශ්‍රේණිය**
**ඉස්ලාම් - උත්තර පත්‍රය.**

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 3 | (21) 1 | (31) 4 |
| (2) 4 | (12) 2 | (22) 3 | (32) 2 |
| (3) 1 | (13) 3 | (23) 3 | (33) 1 |
| (4) 4 | (14) 1 | (24) 2 | (34) 3 |
| (5) 2 | (15) 3 | (25) 3 | (35) 3 |
| (6) 1 | (16) 2 | (26) 2 | (36) 4 |
| (7) 1 | (17) 3 | (27) 3 | (37) 1 |
| (8) 3 | (18) 4 | (28) 2 | (38) 4 |
| (9) 4 | (19) 4 | (29) 4 | (39) 2 |
| (10) 1 | (20) 3 | (30) 4 | (40) 4 |

(01)
1. සලාතය, නෝම්බි, හජ්, ජිහාද්, වැනි
2. බල්ලා, ඌරා හා උන්ගේ අවයවයන්
3. අවසාන අත්තහියියාතය සඳහා වූ ඉඳුම
4. තේ, පළතුරු බීම, බාර්ලි, පළතුරු යුෂ වැනි
5. එය මිරිකා හැර එම ස්ථානයට ජලය ඉසීම.
6. මූසා (අලෛ), දාවුද් (අලෛ), ඊසා (අලෛ), මුහම්මද් (අලෛ)
7. ගුණාංග වේ.
8. නබිවරු, රසුල්වරු, ආගම් ගැන විශ්වාස කිරීම.
9. ඉබ්‍රාහිම් නබිතුමා
10. තුවාල වලට දමා ඇති වෙළුම් හෝ ප්ලාස්ටර්

(10 x 2 = ලකුණු 20)

02)
I. ෆර්ලු අයින්, ෆර්ලු කිෆායා
II. ඉමාම් අහ්මද් බින් හන්බල්, ඉමාම් අබු මන්සුල් අල් මාතුරුදි, ඉමාම් අබු, ජව්ෆර් අත්තහාම්
III. පිරිසිදු චින්තන.
ඉස්ලාමයේ අනුමැතිය.
ෂරීආ නීතිරීති කඩනොකිරීම.
මූලික නැමදුම් වලට බාධා නොවී සිටීම.
සීරුව හා පිළිවෙල. (2+3+5 = ලකුණු 10)

(03)
I. ගැළපෙන වාක්‍ය වලට ලකුණු දෙන්න.
II. පස්වේල් සලාතවලට පෙර, පසු ඇති ඒවා.
ලුහා, පිත්ර්, තහජ්ජද්, ග්‍රහණ සලාත, ඊද් සලාත වැනි
III. ආත්මික භාවය.
පිං ලැබෙයි.
ස්වර්ගය ලැබේ.
පවට සමාව ලැබේ.
හොඳ නරක විචාරනයෙන් පසු වාර්තා පත්‍රිකාව දකුණු අතේ ලැබීම.
කබ්ර්හි වේදනා ඉවත් කෙරේ. මෙලෙස ආද්වික සමඟ සම්බන්ධ සියල්ල. (2+3+5 = ලකුණු 10)

(04)
I. නිසි වේලාවට ගැළපෙන ක්‍රියාවන් කිරීම හෝ මෙලොව හා පරලොව ජීවිතයට, ඒකපුද්ගල සමාජ ජීවිතයටයි ආත්මික ලෞකික ජීවිතයට ගැළපෙන සියලු ක්‍රියාවන් සාලිහ් වන්ත අමල් වේ.
II. ගැළපෙන වාක්‍යයට ලකුණු දෙන්න.
III. මුලින්ම නජීසය ඉවත් කිරීම, හත් වරක් ජලයෙන් සේදීම, ඉන් එක් වරක් දූවිලි සහිත පස් ජලයෙහි මිශ්‍රකර සේදීම. (2+3+5 = ලකුණු 10)

(05) I. සිත් පිරිසිදු භාවය.

II. අන්නෆ්සුල් අම්මාරා බිස්සූත්‍ර.
අන්නෆ්සුල් ලව්වාමා.
අන්නෆ්සුල් මුත්මඉන්නා.

III. පහත් ගුණාංග වලින් මිදීම.
අනිවාර්ය වූ (ෆර්ල්වූ) ඉබාදන් ඉටුකිරීම.
සුන්නත් වූ නැමදුම් ඉටුකිරීම.
දික්ර් කිරීම.
කුර්ආනය පාරායනා කිරීම.
තව්බා කිරීම. (2+3+5 = ලකුණු 10)

(06) I. තපස් ජීවිතය.

II. තව්බා, ඉඛ්ලාස්, සුහ්දි

III. පවිත්‍ර සිතින් තව්බා කිරීම.
කළ පව් සම්පූර්ණයෙන් අත්හැරීම.
කළ පවට කම්පනය වීම.
මිනිසුන් සමග වූ පාපවලට ඔවුන්ගෙන් සමාව අයැදීම. (2+3+5 = ලකුණු 10)

(07) I. ජල හිඟය ඇති වීම.
ජලය නැති වීම.
අසනීප වීම.
ජබීරත් දමා තිබීම.

II. ගැළපෙන දුආ වලට ලකුණු දෙන්න.

III. දේශපාලන හේතුන්.
අන්‍ය ආගම් සංස්කෘති බලපෑම්.
මෝඩ විශ්වාස.
නැණසට වැදගත්කම දීම.
පර්යේෂණ නොකරන්න කියා වැලැක්වූ දේවල් ගැන පර්යේෂණ කිරීම.
ඉල්මුල් සලාම් තසව්වුෆ් යනාදි කලාවන්හි බලපෑම්.
අකීදාවෙහි චාම්භාවය රැකගැනීමට නොහැකි වීම.